[ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

**වී පර්යේෂණ ස්ථානය අම්බලන්තොට - විසින් නිකුත් කරන ලද වී වර්ග**

| වී වර්ගයේ නම | නිකුත් කළ වර්ෂය | වගා කළ හැකි ප්‍රදේශ |
|---|---|---|
| At 16 | 1977 | දකුණු පළාත |
| At 303 | 1990 | රට පුරා වගාවට |
| At 353 | 1992 | මාතර නිල්වලා ප්‍රදේශයේ acid sulphate හා ලවණ තත්ත්වය සඳහා |
| At 354 | 1992 | ලවණතාවය සහිත ප්‍රදේශ සඳහා |
| At 401 | 1992 | ලවණතාවය සහිත ප්‍රදේශ සඳහා |
| At 402 | 1992 | දකුණු පළාත සඳහා |
| At 405 (ලංකා සමෘද්ධි) | 1997 | වියලි හා අතරමැදි කලාපයේ වාරි ජලය ඇති ප්‍රදේශ සඳහා |
| At 362 | 2002 | රට පුරා වගාවට |
| At 306 | 2004 | රට පුරා වගාවට |
| At 307 | 2005 | රට පුරා වගාවට |
| At 308 | 2008 | රට පුරා වගාවට |
| At 309 | 2013 | රට පුරා වගාවට |
| At 373 (අම්බලන්තොට සුවඳ සම්බා) | 2014 | රටපුරා වගාවට |
| At 311(නීරෝගා) | 2015 | රටපුරා වගාවට |
| At 313 | 2020 | රට පුරා වගාවට |
| At 378 | 2022 | රටපුරා වගාවට |

*මූලාශ්‍රය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න කල් ගත්තා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, දැන් ප්‍රශ්න ඇසීමේ වාරය අවසානයි.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නවලට වෙන් කළ වෙලාව ඉවරයි.
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු විපක්ෂ නායකතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අක්‍රමිකතා
### இலங்கை கிரிக்கெட்டில் முறைகேடுகள்
### IRREGULARITIES AT SRI LANKA CRICKET

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

මෙරට ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් මේ වන විට විශාල අර්බුදයක් ගොඩනැඟී තිබෙනවා. ක්‍රිකට් ආයතනය මෙම අර්බුදය ඇති වීම සඳහා සෘජුවම දායක වී ඇති බව වාර්තා වෙනවා. එමෙන්ම, පසුගිය කාලයේ වාර්තා වූ විවිධ දූෂණ, අක්‍රමිකතා සම්බන්ධ චෝදනා, විගණකාධිපති වාර්තාවෙන් මතු වූ කරුණු අනුව ක්‍රිකට් ආයතනය මෙරට ක්‍රිකට් ක්‍රීඩාවේ දරුණු පසුබෑමට වග කිව යුතු බව පැහැදිලි වෙනවා. ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලිය අතරතුර ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලයක් පත් කිරීම, අමාත්‍යවරයාගේ තීරණය විමර්ශනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කිරීම සහ අභියාචනාධිකරණය විසින් අතුරු පාලක මණ්ඩලයේ කටයුතු බල රහිත කර නැවත පෙර ක්‍රිකට් ආයතනය බලාත්මක කිරීම නිසා මෙරට ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනය සම්බන්ධයෙන් ඇතිව ඇති අර්බුදය මේ වන විටත් තීව්‍ර වී තිබෙනවා.

විශේෂයෙන්ම ඊයේ පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනා ඒකමතිකව යෝජනා කළා, පවතින ක්‍රිකට් ආයතනයේ නිලධාරින් ඉවත් විය යුතුයි කියන කාරණාව.

අපි හැමෝම දන්නවා, ඊයේ කරපු ඒ ක්‍රියාව බොහොම උදාරතර ක්‍රියාවක් කියලා. ඒ පිළිබඳව විපක්ෂයේ සියලුදෙනාටත්, ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාටත් අපේ ස්තුතිය පුද කර සිටිනවා. හැබැයි, ඊයේ කරපු ක්‍රියාවලිය සංකේතාත්මක ක්‍රියාවලියක්. පාර්ලිමේන්තුවේ යෝජනා ස්ථිර කිරීමක් තුළින් ඇත්ත වශයෙන්ම නෛතික බලයක් ක්‍රියාත්මක වීමක් සිදු වෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය නැවතත් මතු කරනකොට කිසි කෙනෙක් කැකෝ ගහන්නේ නැතිව, ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරනවා නම් මේක තවදුරටත් මේ සමාජයේ කතිකාවක් හැටියට ක්‍රියාත්මක කරලා මේ අන්ත දූෂිත හොර කල්ලිය ගෙදර යවන්න කටයුතු කරන්න ඕනෑ. ඒකට කැකෝ ගහන්න දෙයක් නැහැ, හැමෝම එකහයි. ඒ නිසා මම විශේෂයෙන්ම මේ ප්‍රශ්න ටික පරමාදර්ශී ක්‍රියාවක් ඉෂ්ට කරපු රොෂාන් රණසිංහ ඇමතිතුමාට යොමු කරන්න කැමැතියි.

01. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පරිපාලනය සම්බන්ධයෙන් වන සියලු අණ පනත් හා නීති මොනවාද? මෙරට ක්‍රිකට් පාලක මණ්ඩලය පත් කිරීම සිදු වන්නේ කවර නීතියක් යටතේද? එම නීතිය යටතේ ක්‍රිකට් පාලක මණ්ඩලයට හිමිවන බලතල කවරේද? ක්‍රිකට් පාලක මණ්ඩලය සඳහා සාමාජිකයන් තෝරා පත් කර ගනු ලබන ක්‍රමය කුමක්ද? අවසන් වරට පත් කරනු ලැබූ ක්‍රිකට් පාලක මණ්ඩලය වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කළ පුද්ගලයන් කවුරුන්ද? එම එක් එක් පුද්ගලයන් සඳහා හිමි වූ ඡන්ද සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, මේ ක්‍රියාවලිය තුළ ඡන්දයක් දැමීම සඳහා පමණක් හොර සංගම් - ව්‍යාජ සංගම් - ලියාපදිංචි කරලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

02. ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලයක් පත් කිරීමට හැකියාව ඇත්තේ කවර අවස්ථාවලදීද? ඒ කුමන නීතියක් යටතේද? අතුරු පාලක මණ්ඩලයට හිමිවන බලතල මොනවාද? ක්‍රිකට් පාලක මණ්ඩලය දේශපාලන අත පෙවීමකින් තොරව කළමනාකරණය විය යුතු බවට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ නිර්ණායක පවතිනවා. වත්මන් අමාත්‍යවරයා පත් කළ අතුරු පාලක කමිටුව නිසා එම නිර්ණායකවලට බලපෑමක් සිදුවේද?

ඒක නම් දැන් පරණ ප්‍රශ්නයක්. මොකද, අතුරු පාලක කමිටුව අද තහනම් නියෝගයකට ලක්වෙලා තිබෙනවා. මම යෝජනා කරනවා, ක්‍රිකට් වෙනුවෙන් එකට එකතු වුණා වාගේම දූෂිත අධිකරණමය ක්‍රියාවලියක් වුණොත්, ඒ සඳහාත් එකතු වෙමු කියලා. මොකද, සමස්තයක් හැටියට අධිකරණය පිරිසිදුයි. සියයට 99.99ක් පිරිසිදුයි. නමුත්, දූෂිත අධිකරණ ක්‍රියාවලියක් පිළිබඳව පක්ෂ විපක්ෂ සියලුදෙනාම එකට එකතුවෙලා යම්කිසි ව්‍යවස්ථාමය නෛතික තීන්දුවකට ප්‍රවේශ වන්නට ඕනෑ කියා අපි ඉල්ලීමක් කරනවා. ඒ සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න.

03. මෙරට ලියාපදිංචි ක්‍රිකට් ක්‍රීඩා සමාජ කොපමණ තිබෙනවාද? ඒ මොනවාද? එම සියලු ක්‍රිකට් ක්‍රීඩා සමාජ මෙරට ක්‍රිකට් ක්‍රීඩාව සඳහා නව ක්‍රීඩකයන් බිහි කිරීම කෙරෙහි ඉහළ දායකත්වයක් ලබා දෙන්නේද? නොඑසේ නම්, ඇතැම් ක්‍රිකට් ක්‍රීඩා සමාජ පවතින්නේ හුදෙක් ක්‍රිකට් පාලක මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය ඡන්ද ලබා ගැනීම සඳහා පමණක්ද? මෙම ක්‍රිකට් ක්‍රීඩා සමාජ නිසි නියාමනයකට ලක් කිරීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී තිබේද? එසේ නම් ඒ පිළිබඳව ක්‍රීඩා ඇමතිතුමාත්, රජයත් අරගෙන තිබෙන පියවර මොනවාද?

අපි දන්නවා, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් වාර්තා ගණනාවක් එළි දක්වා තිබෙන බව. චිත්‍රසිරි කමිටු වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දූෂණ සහ අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීමට පත් කළ කුසලා සරෝජිනී කමිටු වාර්තාව තිබෙනවා. Audit Report එකක් තිබෙනවා. මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලනවා, මේ Audit Report එකේ සඳහන් කර තිබෙන දූෂණ, වංචා හා හොරකම් පිළිබඳව සොයා බලා, ඒ වෙනුවෙන් පියවර ගන්න කියලා නීතිපතිවරයාට නියෝග කිරීමට කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීවරු දෙසිය විසිපස්දෙනා වෙනුවෙන් ඒක ක්‍රියාත්මක කරන්න කියාත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

04. වත්මන් ක්‍රිකට් ආයතනය විසින් පසුගිය දිනවල කැඳ වූ මාධ්‍ය හමුවකදී ක්‍රිකට් ආයතනය රාජ්‍ය ප්‍රතිපාදන මඟින් නඩත්තු වන ආයතනයක් නොවන බවත්, ඒ නිසා එහි කිසිදු කර්තව්‍යයක් සම්බන්ධයෙන් රජයට වගකිව යුතු නොවන බවත් ප්‍රකාශ කර තිබුණා.

මම ගරු කථානායකතුමාගෙන් අහන්න කැමැතියි, ආණ්ඩුවට, පාර්ලිමේන්තුවට, ව්‍යවස්ථාදායක සභාවට, විධායකයට හා අධිකරණයට වැඩිය ඉහළින්ද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තිබෙන්නේ කියලා. අද ක්‍රිකට් ක්‍රීඩාව විනාශ කරන ක්‍රිකට් ආයතනය තුළ ජාවාරම්කාර ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙනවා. ඔය ක්‍රිකට් ජාවාරම්කාර ත්‍රස්තවාදයත් මුලිනුපුටා දමන්නට අපි හැමෝම භේදයකින් තොරව එකතු වෙන්නට ඕනෑ. ශ්‍රී ලාංකික නාමය ලොවට රැගෙන යන ක්‍රිකට් ක්‍රීඩාව මෙහෙයවීම කරනු ලබන පාලකයන් මෙරට ජනතාව විසින් පත් කරනු ලැබූ රජයට වග කිව යුතු නොවන්නේද? ක්‍රිකට් ආයතනය රජයට වගකිව යුතු නැද්ද? ක්‍රීඩා අමාත්‍යාංශයට වගකිව යුතු නැද්ද? මේගොල්ලන් හරියට කටයුතු කරන්නේ වෙනම රාජ්‍යයක් හැටියටයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වර්තමාන පරිපාලන කණ්ඩායමට එහෙම වෙනම රාජ්‍යයක් හැටියට කටයුතු කරන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි.

05. ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලොව ඉහළ නාමයක් දිනා ගත් රටක් වන අතර, මෙරට ක්‍රීඩකයන්ටද ලොව ඉහළ පිළිගැනීමක් පැවතුණි. වත්මනයේ මෙරට ක්‍රිකට් ක්‍රීඩාව සහ ක්‍රීඩකයන් පත්ව ඇති ඛේදනීය තත්ත්වය ඇති වීමට හේතු කවරේද? ඒ සඳහා වග කිව යුත්තේ කවුරුන්ද? මේ සම්බන්ධයෙන් හෝ වගකීම ක්‍රිකට් පාලක මණ්ඩලය නොදරන්නේද? එසේ නම්, ක්‍රිකට් පාලක මණ්ඩලය සතු වගකීම කුමක්ද?

06. වත්මන් ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් පසුගිය ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී සිදු කර ඇති වංචා සහ දූෂණ සම්බන්ධයෙන් පසුගිය දිනවල දිගින් දිගටම කරුණු හෙළිදරව් විය. මෙම වංචා සහ දූෂණ සම්බන්ධයෙන් රජය මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද? ඒ මොනවාද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නිශ්ශබ්ද වෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම දන්නේ නැහැ, ඇයි කෑ කෝ ගහන්නේ කියලා. ක්‍රිකට් පාලක මණ්ඩලයේ සල්ලිවලට ගිජු වෙච්ච කට්ටියද දන්නේ නැහැ, මේ කෑ ගහන්නේ. කෑ ගහන්න එපා. මුදලට, වරදානවලට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් අළෙවි කරන්න එපා. තමුන්නාන්සේලාගේ සාක්කුවලට සල්ලි ආවා කියලා කෑ කෝ ගහන්න එපා. මේ ප්‍රශ්නය අහන්නේ ආණ්ඩුවට විරුද්ධව නොවෙයි, ක්‍රිකට් ක්‍රීඩාවට පක්ෂව. ඒක නිසා මොනවා හෝ අතට හම්බ වෙලා තිබෙනවා නම් ඒක තියා ගන්න. කෑ කෝ ගහන්න එන්න එපා.

07. ක්‍රිකට් පාලක මණ්ඩලයේ දූෂණ මැඬලීමට හා ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රවර්ධනය සඳහා අතුරු පාලක කමිටුවක් හෝ වෙනත් තනි පුද්ගලයන් මත යැපීම වෙනුවට ස්ථිර වැඩ පිළිවෙළක් රජයට නොමැතිද? එසේ තිබේ නම්, ඒ කවරේද?

ඒ වාගේම මම විශේෂයෙන්ම ඔබතුමාට කරුණු කාරණා කිහිපයක් අවධාරණය කරන්න කැමතියි. මම හිතන විධියට මේ ප්‍රශ්නවලින් පැන නොයන්න ඔබතුමාත් එකඟ වෙනවාය කියන එක අපට විශ්වාසයි.

ගරු කථානායකතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. මේකට ඇමතිතුමාගෙන් මම ඍජු පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, 2018දී සංචාරක එංගලන්ත කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයේදී විකාශන අයිතිය වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හිමි විය යුතු පළමුවන වාරික මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 5.5ක්. ගරු ඇමතිතුමනි කෝ ඒ සල්ලි? කවුද, ඒ කාලයේ වගකීම් දරපු ක්‍රිකට් පාලක මණ්ඩලයේ කණ්ඩායම? කවුද ක්‍රිකට් භාරව හිටපු ඇමතිවරයා? කොහේටද ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 5.5 ගියේ?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ වාගේම අපට ආරංචියි, හොංකොං බැංකුවක තිබෙන Fanya Silu Co. Ltd. නම් ගිණුමේ තිබුණු තැන්පත් මුදල් BBVA Compass කියන ගිණුමකට හුවමාරු වෙලා තිබෙන බව. අපි දැනගන්න කැමතියි, BBVA Compass කියන ඇමෙරිකාවේ තිබෙන ගිණුම පෞද්ගලික ගිණුමක්ද නැත්නම් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අයිති ගිණුමක්ද කියලා. මේවා රට දැනගන්නට ඕනෑ. මේ හොරකම් වහන්න කවුරු කෑ ගැහුවත්, මේ හොරකම් පිළිබඳව මේ රටේ ලක්ෂ 220ම දැනගන්නට ඕනෑ. ඒ නිසා කෑ ගහන්නේ නැතුව ඉන්න.

මේ අවස්ථාවේ මම අහන්න කැමැතියි, විශේෂයෙන්ම අපේ රටට අහිමි වුණු කෝටි-ප්‍රකෝටි ගණනක් වූ ඩොලර් ටික කාගේ සාක්කුවටද ගියේ, කාගේ පොකට් එකටද ගියේ, කාගේ පෞද්ගලික ගිණුමකටද ගියේ කියලා. ඒවා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සල්ලි නොවෙයි. ඒවා ලංකාවට අයිති මුදල්; මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාවට අයිති මුදල්; ක්‍රිකට් ලෝලීන්ට, ක්‍රිකට් ක්‍රීඩකයන්ට අයිති මුදල්; ගම් මට්ටමින්, නගර මට්ටමින්, clubs මට්ටමින්, district level එකෙන්, provincial level එකෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ නියැළෙන අයට අයිති මුදල්. ඒ සල්ලි කොහේටද ගියේ? ඒ සල්ලි පිල්ලි ගැහුවේ කොහොමද? ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේ අංගසම්පූර්ණ උත්තරයක් ලබා දෙන්න.

ඒ වාගේම සංචාරක දකුණු අප්‍රිකානු කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයේ විකාශන අයිතියේ තුන්වැනි වාරිකය වෙනුවෙන් හිමි විය යුතු මුදල ඇමෙරිකානු ඩොලර් 187,084යි. ගරු ඇමතිතුමනි, කොහේටද මේ සල්ලි ගියේ? කාටද මේ සල්ලි ගියේ? ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබිලා නැහැ. ලැබිලා තිබෙනවාද? උත්තරයක් දෙන්න, ගරු ඇමතිතුමනි. කරුණාකරලා තමුන්නාන්සේ මේකට උත්තරයක් දෙන්න. ඒ වාගේම එහි දෙවැනි වාරිකයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 436,541යි. ඒ මුදල කොහේටද ගියේ? ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබුණාද, අපේ රටට ලැබුණාද, එහෙම නැත්නම් කාගේ පෞද්ගලික ගිණුමටද ඒ මුදල් ගියේ කියන එක මේ අවස්ථාවේ මම අහන්න කැමතියි.

අවසාන වශයෙන් ගරු රොෂාන් රණසිංහ ඇමතිතුමාගෙන් මම තව කාරණයක් අහන්න කැමතියි. ඔබතුමාම ඊයේ කිව්වා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හොර කල්ලි, වංචාකාර දූෂිත කල්ලි ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකක් withdraw කරන්නට උත්සාහ දරනවා කියලා. මොකක්ද, එහි වර්තමාන තත්ත්වය? මේ හොර කල්ලිය ඇමෙරිකානු ඩොලර් මිලියන දෙක withdraw කළාද?

මොන බැංකුවෙන්ද withdraw කළේ? ඒක withdraw කරන්න අත්සන් කළේ කවුද? ඒ තීන්දුව ගත්තේ කවුද? ඒ පිළිබඳව මේ රටේ ක්‍රීඩා ලෝලීන් දැනගන්නට ඕනෑ. ලක්ෂ 220ක් වූ ජනතාව, අපි දැන ගන්නට ඕනෑ.

ඒ වාගේම මේ අවස්ථාවේදී මම ඔබතුමාට කාරණයක් කියන්නට කැමැතියි. විශේෂයෙන්ම ඔබතුමා හොයා බලන්න, අපි දන්න විධියට ඊයේ පැවැත්වූ මේ සම්බන්ධ විවාදයෙන් පස්සේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මුදලින් කුලිය - rent එක- ගෙවන සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තිබෙන කාර්යාල කාමරයක ගජ මිතුරන් කණ්ඩායමක්, හොර දූෂිත කල්ලියක් එකට එකතු වෙලා සාකච්ඡා කර තිබෙනවා. ඒ ගොල්ලන් කියලා තිබෙනවා ලු, ඉන්දියාවේ අර ජේ ෂා ට කථා කරලා පැය 48ක්, පැය 72ක් ඇතුළත අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම කොහොම හරි ජාත්‍යන්තර තහනමකට ලක් කරනවා කියලා. මේ සඳහා අපි ගන්න ඕනෑ පියවර මොකක්ද?

ඊයේ ඔබතුමා කිව්වා මේ පාර්ලිමේන්තුවේ ගෙනා යෝජනාවට ඒකමතිකව අපි එකඟ වුණා කියලා. ඒකමතිකව එකඟ වුණාට පස්සේ මේ ක්‍රිකට් දූෂිත කල්ලිය - හොර කල්ලිය - ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සල්ලිවලින් කුලිය ගෙවන සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ කාර්යාල කාමරයක - office room එකක - ඉඳගෙන කියනවා, මෙහෙම නටන්න ආවොත් පැය 24න්, 48න්, 72න් ෂා ට කියලා ශ්‍රී ලංකාවේ ක්‍රිකට්වලට තහංචියක් දමනවා කියලා. මොකක්ද ඒ ගැන මේ 225දෙනා ගන්න තීන්දුව? මොකක්ද අපි ගන්න තීන්දුව? මේ ගොල්ලෝ ක්‍රිකට් තහනම් කරවන්න යන්නේ අපි ප්‍රජාතන්ත්‍රවාදයට ඇඟිලි ගහනවා කියලායි. එතැන තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි, set කරලා, ඡන්ද දීලා, හොරා කන වැඩ පිළිවෙළක්, මංකොල්ල කන වැඩ පිළිවෙළක්. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ලෝකයේ කුමන රටවලද Interim Committee එකක් අද ක්‍රියාත්මක වෙන්නේ කියලා. මම දන්නා තරමින් South Africaවල ක්‍රියාත්මක වෙනවා. තවත් රටක් තිබෙනවා. ඒ ගොල්ලන්ට international තහංචි නැහැ. ඒ පිළිබඳව තමුන්නාන්සේගේ- *[බාධා කිරීමක්]*

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, පොඩ්ඩක් ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් තිබෙනවා, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනේ! ගරු කථානායකතුමනි, මගේ කථාව තව ටිකකින් ඉවරයි. ඊට පස්සේ ඕනෑ දෙයක් කථා කරන්න කියන්න. *[බාධා කිරීමක්]*

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ගරු කථානායකතුමනි, අනේ පව් එතුමා! එතුමා අසනීප වෙලා ඉන්නේ. එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා. නමුත්, ප්‍රශ්නය ඒක නොවෙයි. හරියට, cricket tournament එකක් ගහලා පරාද වෙලා නැවත ඒ tournament එකට ඇවිල්ලා ගහනවා වාගේ - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, එතුමන්ලා ගැන මම කනගාටු වෙනවා. ඊයේ අපි දිනපු දේ, ඒ ඒකමතික තීන්දුව පරාජයක්ද?

ඒක පරාජයක්ද? අපි ඔක්කෝම එකතුවෙලා, කථානායකතුමාම ඒකමතිකයි කියපු එක පරාජයක් ද? මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒක තේරෙන්නේ නැහැ. මොකද, එයාට තේරෙන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
***[Expunged on the order of the Chair.]***

විතරයි. එයාගේ මාමා කළේත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එක විතරයි. *[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දොඩවන්නේ නැතිව වාඩිවෙනවා. *[බාධා කිරීමක්] -*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අදාළ කථාව කරගෙන යන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, ඒ කථා කරන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පගා සල්ලි; හොර සල්ලි; අල්ලස් සල්ලි බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට අදාළ කථාව කරගෙන යන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඊයේ ඡන්දයක් ඉල්ලන්න කිව්වේත් මේ වාගේ අයගේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නිරුවත හෙළිකරන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කථාව කරගෙන යන්න, කොහේවත් යන ඒවාට පැටලෙන්නේ නැතිව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නිසා- *[බාධා කිරීමක්]* කටට මම භය නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චින්තක අමල් මායාදුන්න මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. Point of Order එකක් තිබෙනවා නම් කියන්න. *[බාධා කිරීමක්]* අනවශ්‍ය ප්‍රශ්න මතු කරන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ක්‍රීඩා ඇමතිතුමනි, සිනමන් ග්‍රෑන්ඩ් එකේ ඉඳගෙන ශ්‍රී ලංකාවේ ක්‍රිකට්වලට විරුද්ධව කරපු මේ කුමන්ත්‍රණය ගැන ඔබතුමා ගන්නා පියවර මොකක්ද? *[බාධා කිරීමක්]*

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා මගේ නම කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ. කරුණාකර ඔබතුමා නිශ්ශබ්දව ඉන්න.

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමාගේ කථාවෙන් පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්. එතෙක් නිශ්ශබ්දව ඉන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, කථාව අහගෙන ඉඳලා ඔබතුමා උත්තර දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ලංකාවේ ක්‍රිකට් තහනම් කරනවා කියන එක තමයි රාජද්‍රෝහී, දේශද්‍රෝහී ක්‍රියාවලිය. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වර්තමාන ලොක්කෝ කියා තිබෙනවා, පැය 24න්, පැය 48න්, පැය 72න් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් තහනම් කරනවා කියලා; ජාත්‍යන්තරව තහනම් කරනවාය කියලා. ඒ ගැන ඇමතිතුමාගේ පිළිතුර ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීමක්]-*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චින්තක අමල් මායාදුන්න මන්ත්‍රීතුමනි, බොරු දොඩවන්නේ නැතිව ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ගරු කථානායකතුමනි, 88-89 කාලයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නැහැ. අම්මාගේ ෆොටෝ එකක් ගැහුවා කියලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නැහැ. නංගිලා වාගේ හොර සල්ලි අච්චු ගැහුවේ නැහැ. ගරු කථානායකතුමනි, හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ. ගරු විපක්ෂ නායකතුමා ඒවාට පැටලෙන්න යන්නේ නැතිව කථාව කරගෙන යන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඒ කථා කරන අය පදිංචි වෙලා ඉන්නේ මගේ තාත්තා ඒ ගොල්ලන්ට දුන්නු ගම්උදාව භූමියේ ඉඩමේ. ද.මු. දසනායක මැතිතුමාට ඉඩම දුන්නේ මගේ තාත්තා. මම අහන්නේ, ඒ අය වස්ත්‍රයක් ඇඳගෙනද කථා කරන්නේ කියලා. ලජ්ජයි!

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඊයේ අපි ලබපු සාර්ථකත්වය තුළ ක්‍රිකට් වෙනුවෙන් පාර්ලිමේන්තු සංසදයට ඔබතුමා ඉඩක් දෙන්න._ඔබතුමාගෙන් ඊයේ මම ඉල්ලීම් කළත්, Division එකකට අවස්ථාව දුන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ තීන්දුව ඒකමතිකයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කමක් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා අනුමැතිය දෙන්න. ක්‍රිකට් වෙනුවෙන් පාර්ලිමේන්තු සංසදය හදලා, මේ රටේ ක්‍රිකට් තහනමක් ක්‍රියාත්මක කරන්න හදන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හොර කල්ලිය, දූෂිත කල්ලිය, මත් කුඩු කල්ලිය, ගණිකා කල්ලිය පරාජය කරන්නට ක්‍රීඩා ඇමතිතුමාට දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. කරුණාකර මගේ ප්‍රශ්නවලට උත්තර සපයන්න.*[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඉක්මනින් උත්තර දීලා අවසන් කරන්න.

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ගරු කථානායකතුමනි, ඔබතුමා මගේ point of Order එකට අවස්ථාව දෙනවා කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව දුන්නා. ඒ වෙලාවේ ඔබතුමා වෙන දේවල් කථා කළේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට අවස්ථාවක් දුන්නා නේ. දැන් කථා කරන්න එපා. මේ රණ්ඩුවලට පැටලෙන්න යන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඉවර කරලා ඉන්න. නැත්නම් මේක කියන්න බැහැ.*[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු චින්තක අමල් මායාදුන්න මන්ත්‍රීතුමා කියන දේ කියන්න.

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
මට ගරු රොෂාන් රණසිංහ ඇමතිතුමා එක්ක ප්‍රශ්නයක් නැහැ. මට ද.මු. දසනායක මැතිතුමා ගැන කියන්න ඕනෑ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ද.මු. දසනායක කියන්නේ මේ රටේ වැදගත් දේශපාලන නායකයෙක්. එතුමා කිසිම තැනක මිනී මරලා නැහැ. මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ මිනී මරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, නිකම් ප්‍රශ්න ඇති කරන්නේ නැතුව කරුණාකරලා ඉඳගන්න. ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි, සමාවෙලා මගේ කථාවට අවධානය දෙන්න. මම විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට උත්තර දෙනවා. ඊට කලින් මටත් ප්‍රශ්නයක් තිබෙනවා. මම ඊයේත්, පෙරේදාත් කිව්වා, ක්‍රිකට් ආයතනය සම්බන්ධ මේ ප්‍රශ්නයට තිබෙන එකම විසඳුම 2018-2023 දක්වා forensic audit එකක් කරන එක කියලා. ඒකට මට පිළිතුරක් ආවේ නැහැ, ගරු කථානායකතුමනි. ඒක කරන ක්‍රමය මොකක්ද? මම ගියා විගණකාධිපතිතුමාගේ

කාර්යාලයටම, protocol පැත්තක තියලා. ඒ ගිහිල්ලා එතුමාට කථා කරලා මම ඉල්ලුවේ, වෝහාරික විගණනයක් කරලා දෙන්න කියලායි. එතුමා කිව්වා, එතුමා යටත් වෙන්නේ පාර්ලිමේන්තුවට විතරයි. පාර්ලිමේන්තුවෙන් ඉල්ලුවොත් පමණයි ඒක කරන්න පුළුවන් කියලා. ඒ නිසා මට ඉස්සෙල්ලාම ඒ forensic audit එක කරන ක්‍රමය පැහැදිලි කළා නම් හොඳයි. ගරු කථානායකතුමනි, ඒකට උත්තරයක් දෙන්න පුළුවන් නම් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒක අමාත්‍යාංශ ලේකම් හරහා ඔබතුමා Auditor-Generalට යොමු කරන්න.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
නැහැ, ඒක වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් COPE එකට යොමු කරන්න. *[බාධා කිරීම්]* ගරු දයාසිරි ජයසේකර මැතිතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, COPE එක - අපේ අනුර දිසානායක මැතිතුමාත් මේ ගැන කථා කරයි - සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා සභාපති ධුරය දරපු කාල වකවානුවේ මේ පිළිබඳ forensic audit එකක් කළා. ඇමතිතුමාට ඒ ආපහු වෙනත් forensic audit එකක් කරන්න අවශ්‍ය නම්, කථානායකතුමා කිව්වා වාගේ ලේකම්තුමා හරහා අපට ඉල්ලීමක් එව්වා නම්, ඒ අවශ්‍ය කටයුතු ටික කරන්න අපට පුළුවන්. මම හිතන විධියට ඒක තමයි කරන්න තිබෙන හොඳම ක්‍රියාදාමය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, ක්‍රිකට් ආයතනයේ ප්‍රශ්නය අද ඊයේ පැන නැඟුණු එකක් නොවෙයි. දීර්ඝ කාලයක් තිස්සේ ඒ ප්‍රශ්නය තිබුණා.*[බාධා කිරීමක්]* මොකක්ද, කවුද කියන්නේ? *[බාධා කිරීමක්]* ඒ ගැන මම දවල්ට මගේ කථාවේදී කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කොහේවත් යන ඒවාට පැටලෙන්නේ නැතිව කියන්න ආපු කාරණය කියන්න. *[බාධා කිරීමක්]*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සභාපතිත්වය දැරූ COPE එකෙන් මේ පිළිබඳව forensic audit එකක් කළා. ඒ සම්පූර්ණ වාර්තාව තිබෙනවා. දැන් ඔබතුමන්ලාට තිබෙන්නේ ඒ වාර්තාව ක්‍රියාත්මක කරන එක. ඒක ක්‍රීඩා අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා හෝ නීතිපතිතුමා හරහා ක්‍රියාත්මක කරන්න. ඒකේ දත්ත, තොරතුරු ඇති තරම් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා තවදුරටත් වාර්තා කිරීම හෝ පරීක්ෂා කිරීම නොවෙයි දැන් කළ යුත්තේ, පරීක්ෂා කරලා ඉදිරිපත් කර තිබෙන වාර්තාවලට අනුව ක්‍රියාමාර්ග ගැනීම. අලුත් දේවල් තිබෙනවා නම් ඒ අලුත් දේවල් ගැන පරීක්ෂා කරන්න.

මට මතකයි, ඒ වෙලාවේ නියෝජ්‍ය කථානායකතුමා හැටියට හිටියේ තිලංග සුමතිපාල මැතිතුමා. ඒ වෙලාවේ COPE එකට තිලංග සුමතිපාල මැතිතුමාත් කැඳෙව්වා, ඇමෙරිකා එක්සත් ජනපදයේ ගිණුම පිළිබඳව, ඒ වාගේම අප්‍රිකානු සංචාර පිළිබඳව අහන්න. මේ ඔක්කෝම පිළිබඳව ඉතාම විධිමත් වාර්තාවක් තිබෙනවා. COPE එකට පුළුවන් ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම විතරයි. ගරු කථානායකතුමනි, දැන් තිබෙන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ වාර්තාව නීතිපතිවරයාට යොමු කරලා, අදාළ ක්‍රියාමාර්ග ගැනීමයි.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ඊයේත් මතු කළා, මේ ටිකේමත් මතු කරනවා මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කියලා. දැන් අපේ ගරු මන්ත්‍රීවරුත් කිව්වා COPE එකට මේ සඳහා පූර්ණ බලය තිබෙන බව. පරීක්ෂණයක් කරලා report එකකුත් තිබෙනවා. අලුත් චෝදනාත් ඇවිල්ලා තිබෙනවා. ඉතින් අපට එව්වා නම්, COPE එකේ සභාපතිතුමාට එව්වා නම්, - මම COPE එකේ සාමාජිකයෙක් - අපි ඉතා ඉක්මනින් ඒ පිළිබඳව කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, හරි නේ? ඔබතුමාගේ ප්‍රශ්නය විසඳුණා.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු කථානායකතුමනි, මම ඉල්ලන්නේ Sri Lanka Cricket එකේ forensic audit එකට ප්‍රමුඛතාව දෙන්න කියලා. මොකද, 2019දී තමයි LPL එක තිබුණේ. ඒ LPL එකේ ලොකු වංචාවක් තිබුණා. ලංකාවේ පවත්වන්න තිබුණු තරගාවලිය ඩුබායිවලට ගෙන ගිහිල්ලා එතැන වංචාවක් වෙලා තිබෙනවා. කලින් කරලා තිබුණේ වෝහාරික විගණනයක් නොවෙයි, විගණනයක්. ඒ හින්දා වෝහාරික විගණනයක් -forensic audit එකක්- තමයි ඉල්ලන්නේ. අනෙක් වැඩ පැත්තක තියලා ඔබතුමා ඒකට ප්‍රමුඛතාව දෙන්න කියලා නියෝගයක් දෙන්න.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார - வெளிநாட்டு வேலைவாய்ப்பு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Jagath Pushpakumara - State Minister of Foreign Employment Promotion)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද රීති ප්‍රශ්නය, ගරු ජගත් පුෂ්පකුමාර රාජ්‍ය අමාත්‍යතුමා?

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, මම COPE එකේ සාමාජිකයෙකු හැටියටයි මේ කාරණය කියන්නේ. අපේ ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබතුමා නියෝගයක් දෙන්න. අනෙක් පරීක්ෂණ නවත්වා මෙය කඩිනම් කරන්න කියා ඔබතුමා අපේ කාරක සභාවේ සභාපතිතුමාට නියෝගයක් දෙන්න. අපි වහාම ඒ ආයතනය කැඳවා කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට ඒ සම්බන්ධ වාර්තා එවන්න. මම නියෝගය දෙන්නම්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, අද අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලංකාවට ආවා. ඒ කණ්ඩායමේ හිටියා, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ තේරීම් කමිටු ප්‍රධානී ප්‍රමෝද්‍යා වික්‍රමසිංහ මහත්මයා. එතුමා එතැනදී බරපතළ ප්‍රකාශයක් කර තිබෙනවා, තරග පරාජයට හේතුව කණ්ඩායමෙන් පිටත සිදු වන කුමන්ත්‍රණයක් බව. ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු ඇමතිතුමනි, මේක ඉතාම බරපතළ කාරණයක්. මේ කුමන්ත්‍රණය මොකක්ද කියලා සොයා බැලීම සහ හෙළිදරව් කිරීම රටටම වැදගත්. ඒ නිසා මම ගරු ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ක්‍රීඩා ඇමතිවරයා විධියට ඔබතුමා වහාම තේරීම් කමිටු ප්‍රධානියා සහ ඒ කණ්ඩායමත් එක්ක ගමන් කරපු කළමනාකරණ කණ්ඩායම කැඳවා, මොකක්ද ඒ කුමන්ත්‍රණය කියලා ඒ අය සමඟ සාකච්ඡා කරන්න. මොකද, ඒක දැන ගැනීම අපි සියලුදෙනාට වැදගත් කියා මා විශ්වාස කරනවා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් පුෂ්පකුමාර රාජ්‍ය ඇමතිතුමනි, ඉක්මන් කරන්න.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, මම මේ ගරු සභාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා ඒ කාරණයට ප්‍රමුඛතාව දෙන්න කියලා. නැවත මා ලිඛිත ඉල්ලීමක් කරන්නේ කුමන කාරණාවක් සඳහා ද? මේ සභාවේදීයි මම ඒ ඉල්ලීම කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නොවෙයි. ගරු ඇමතිතුමා ඒ කාරණය ඉදිරියට ගෙන යයි. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පරිපාලනය හා සම්බන්ධ වන සියලු අණ පනත් හා නීති මොනවාද කියන එක මා කෙටියෙන් කියන්නම්.

1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ පනත අනුව නිකුත් කරන ලද රෙගුලාසි හා වරින් වර සංශෝධනය කරන ලද රෙගුලාසි, ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධාන හා ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව අනුව පරිපාලනය වේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ඇමුණුම 01 මඟින් ද, ඊට අදාළ සංශෝධන ඇමුණුම 02, 03 හා 04 මඟින් ද දක්වා ඇත. අදාළ නියෝග ඇමුණුම 05 මඟින් දක්වා ඇත.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඇමුණුම් තිබෙනවා නේද?

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු විපක්ෂ නායකතුමනි, අංක 01 සිට 05 දක්වා ඇමුණුම් මම **සභාගත*** කරනවා. ඒවා ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

ඉහත 1හි සඳහන් අණ පනත් හා නීති අනුව ක්‍රිකට් පාලක මණ්ඩලය පත් කිරීම සිදු වේ. ඉහත සඳහන් අණපනත් යටතේ පනවනු ලබන රෙගුලාසි, නියෝග සහ ක්‍රිකට් ව්‍යවස්ථාව අනුව බලතල පැවරේ.

ඉහත සඳහන් අණපනත් සහ ක්‍රිකට් ව්‍යවස්ථාව අනුව සුදුසුකම් ලබන පළාත් සංගම්, දිස්ත්‍රික් සංගම්, පාලක ක්‍රීඩා සමාජ - controlling clubs - ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් වශයෙන් අනුබද්ධ වී ඇත. මෙම සාමාජිකයන්ගෙන් ඡන්ද හිමි අනුබද්ධ සාමාජිකයන්ගෙන් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා, එමඟින් නිලවරණ කමිටුවක් පත් කර, එම නිලවරණ කමිටුව මඟින් නිලවරණය පවත්වා ව්‍යවස්ථාවට අදාළ නිලධාරි මණ්ඩලය පත් කර ගනු ලබයි.

අවසන් වරට පත් වූ නිලධාරීන් නිතරගයෙන් එම තනතුරු සඳහා තේරී පත්ව ඇත. (ඇමුණුම 06 - නිලවරණ වාර්තාව 2023.05.20වන දින පවත්වන ලද නිලවරණයේ කමිටු වාර්තාව.) ඇමුණුම 06 **සභාගත*** කරමි.

02. 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ අංක 32 වගන්තියට අදාළ "අ", "ආ", "ඇ" උප වගන්තිවලට අනුව යම් ජාතික ක්‍රීඩා සංගමයක් ක්‍රියා කරයි නම්, ලියාපදිංචිය අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය. විස්තර ඇමුණුම 07 මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම 07 **සභාගත*** කරමි.

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ අංක 32, 33 හා 34 වගන්ති අනුවයි.

ක්‍රීඩා පනත හා රෙගුලාසි යනු, ශ්‍රී ලංකාවේ පවතින වත්මන් නීතියයි. ඒ අනුව එම නීතියට සියලු දෙනා සහ ආයතන යටත් විය යුතුය. මෙම අත්හිටුවීමට දායක වූ කරුණු සම්බන්ධයෙන් ICC එක දැනුවත් කිරීම මඟින් බලපෑමක් ඇති වීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සිදු කර තිබේ. මොකද, මෙය වෙනත් කටයුත්තක් නිසා තීන්දු වන දෙයක් නොව, මූල්‍ය අවභාවිතය, දූෂණය, වංචාව, අක්‍රමිකතාව නිසා සිදු වන දෙයක්. ඒක අපි තීන්දු කරපු එකක් නොවෙයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ රටේ විගණනය සඳහා තිබෙන උත්තරීතර ආයතනය වන ජාතික විගණන කොමිෂන් සභාව ගත්තු ඒ නිර්දේශ අනුවයි ඒ කටයුත්ත කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමනි.

03. පළාත් 5යි. ඒ වාගේම ක්‍රිකට් සංගම් 6යි. Cricket associations කියලායි ඒවාට කියන්නේ. දිස්ත්‍රික් සංගම් - district cricket associations - 22යි. Controlling clubs කියලා 29ක් තිබෙනවා. මෙන්න මේක ගොඩක් වෙලාවට ප්‍රශ්න තිබෙන තැනක්. ඒ වාගේම affiliated clubs කියලා තවත් 23ක් තිබෙනවා. ඔක්කෝම 85යි. අපි නව රෙගුලාසියක් ගෙනැල්ලා තිබෙනවා, දිස්ත්‍රික්ක විසිපහට 25යි. උපරිමය යන්න පුළුවන් පළාත් නවයට 9යි. ඒ වාගේම, එක සමාජයකට ඡන්ද 1යි.

ඒ විස්තර ඇමුණුම 08 මඟින් දක්වා ඇත. එම ඇමුණුම **සභාගත*** කරමි.

ක්‍රිකට් ක්‍රීඩා සමාජ අතරින් සමහර ක්‍රීඩා සමාජ පමණක් නව ක්‍රිකට් ක්‍රීඩකයන් බිහි කිරීම සඳහා දායකත්වයක් ලබා දේ. නාමික ඡන්දය ලබා ගැනීම සඳහා පමණක් ඇති ක්‍රීඩා සමාජ ද පවතින තත්ත්වයක් ඇත. ශ්‍රී ලංකා ක්‍රිකට් විශේෂ මහා සභා රැස්වීමකින් පත් කරන ලද නිලවරණ කමිටුව මඟින් ක්‍රීඩා සමාජ, දිස්ත්‍රික් සංගම්, පළාත් සංගම්වල සුදුසුකම් පරීක්ෂා කර බලා ඡන්ද අයිතිය තීරණය කරනු ලබයි. මේ සම්බන්ධයෙන් පවතින රෙගුලාසි ප්‍රමාණවත් නොමැති නිසා 2022.12.14 වන දින නිකුත් කරන ලද 2310/26 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නව රෙගුලාසි පනවා මෙම දිස්ත්‍රික් සංගම්, පළාත් සංගම් සහ ක්‍රීඩා සමාජ නියාමනය කිරීමේ අණ පනත් පැනවීමට කටයුතු කර ඇත. එම අතිවිශේෂ ගැසට් නිවේදනය ඇමුණුම 09 වශයෙන් **සභාගත*** කරමි.

04. 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා ඒ අනුව පනවන ලද රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් යනු ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සම්මේලනයක්, සංගමයක් වේ. ඒ අනුව එහි සඳහන් නීති රෙගුලාසිවලට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ද අනුගත විය යුතු අතර ඒ අනුව කටයුතු කිරීම අනිවාර්ය වේ. එමෙන්ම ක්‍රීඩා පනත හා රෙගුලාසි අනුව රජයේ විගණකාධිපති විසින් සිදු කරනු ලබන විගණනයට ද යටත් විය යුතු ය. ඒ අනුව මෙය රජයට වගකිව යුතු ආයතනයක් වේ.

05. ගරු කථානායකතුමනි, මේ යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් අසා ඇති කාරණයට හේතුව විධියට ගන්න තිබෙන්නේ පරිපාලනය ගත්ත තීන්දු. පරිපාලනයේ නිසි කළමනාකරණයක් නැති වීම.

අනිවාර්යයෙන්ම ක්‍රිකට් පාලක මණ්ඩලය මේ වගකීම ගන්න ඕනෑ. ක්‍රිකට් පාලක මණ්ඩලය සතු වගකීම තමයි මේ රටේ ගෞරවය ආරක්ෂා කරමින් මේ රටේ නීතියට අනුව, ඒ වාගේම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය - ICC එක - ගෙනෙන නීතිවලට අනුව ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා ජාතික කණ්ඩායම සහභාගි කරවීම, ඒ වාගේම රට තුළ ක්‍රිකට් ප්‍රචලිත කිරීම, සංවර්ධනය කිරීම, දියුණු කිරීම, පාසල් පද්ධතියට ක්‍රිකට් ක්‍රීඩාව ගෙනයෑම, ඊට අනුබද්ධ ක්‍රීඩා සංගම්වලට අවශ්‍ය සහයෝගය ලබා දීම, විනිසුරුවන් දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම, පුහුණුකරුවන් ඇති කිරීම වැනි වගකීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා.

06. ඔව්.

- ඕස්ට්‍රේලියාවේ පැවැති 2022 අයිසීසී (පිරිමි) ටී20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් පත් කරන ලද විශ්‍රාමික මහාධිකරණ විනිසුරු කුසලා සරෝජනී වීරවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් පංච පුද්ගල කමිටුව විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව අවශ්‍ය නෛතික උපදෙස් හා නිර්දේශ ලබා ගැනීම සඳහා 2023.01.18 දින ගරු නීතිපතිතුමා වෙත යොමු කිරීම.
- එමෙන්ම, නීතිපතිතුමාගේ උපදෙස් හා නිර්දේශ ලැබීමෙන් අනතුරුව අවශ්‍ය කටයුතු කිරීම සඳහා ඉදිරිපත් කරන තෙක් මෙම වාර්තාව රහස්‍ය වාර්තාවක් ලෙස අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යක්ෂ, ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය වෙත 2023.01.19 දින යොමු කිරීම.
- ගරු නීතිපතිතුමා විසින් එම විමර්ශන වාර්තාව රජයේ විගණන කාර්යාලයට යොමු කර විගණන වාර්තාවක් ලබා ගැනීමට 2023.01.27 දිනැති ලිපිය මඟින් උපදෙස් දීම.
- විගණකාධිපති විසින් 2023.09.11 වන දින විගණන වාර්තාව නිකුත් කිරීම.
- විගණකාධිපති විසින් යොමු කළ විගණන වාර්තාව හා විශ්‍රාමික මහාධිකරණ විනිසුරු කුසලා සරෝජනී වීරවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් පංච පුද්ගල කමිටුව විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව, 2023.10.03 දින විමර්ශනයක් කිරීම සඳහා අධ්‍යක්ෂ, ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය වෙත යොමු කිරීම.

  අධ්‍යක්ෂ, ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය මඟින් විමර්ශනයක් කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පුද්ගලයන් කැඳවා ගැනීමට අසීරු තත්ත්වයක් නිරීක්ෂණය වූ බැවින්, මේ සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ, ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය විසින් 2023.10.23 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මඟින් යොමු කර තිබීම.

ඒ කියන්නේ, ක්‍රීඩාවේ වංචා හා දූෂණ වැළැක්වීමේ ඒකකයෙන් පසුගිය දිනවල match-fixing සම්බන්ධයෙන් ක්‍රීඩකයෙකුත් නීතිපති දෙපාර්තමේන්තුවම මැදිහත් වෙලා අධිකරණයටත් ගෙනියනවා. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නියෝජනය කරමින් නීතිඥයෙක් ඇවිල්ලා පෙන්වලා දෙනවා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න බලතල මදි, ඒ සඳහා බලතල දෙන්න ඕනෑ කියලා. එය අභියෝගයකට ලක් කරලා තිබෙනවා. නීතිපතිතුමාගෙන් ඒ සම්බන්ධව උපදෙස් ඉල්ලා තිබෙනවා. ඒ වාගේම 2023.09.25වැනි දා ගරු නීතිපතිතුමා සහ පොලිස්පතිතුමා ලිපියකින් දැනුවත් කරලා තිබෙනවා, විගණකාධිපතිතුමා කියලා තිබෙන්නේ මේ සම්බන්ධව නීතිමය ක්‍රියා මාර්ග ගන්න කියලා. නීතිමය ක්‍රියා මාර්ග ගන්න කියන ඒ ඉල්ලීම කරලා තිබෙනවා. ඒ වාගේම මා හමු වී ඒ සම්බන්ධව නැවත අවධාරණය කළා, නීතිමය ක්‍රියා මාර්ග ගන්න කියලා. දූරකථනයෙන් පස් වතාවක් නීතිමය ක්‍රියා මාර්ග ගන්න, එය කඩිනම් කරන්න කියන ඉල්ලීම කරලා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රොෂාන් රණසිංහ මහතා]

07. ශ්‍රී ලංකා ක්‍රිකට්හි දූෂණ මැඩලීමට දැනට සිටින නිලධාරි මණ්ඩලය බලයේ සිටියදී ඔවුන්ගේ සහාය නිසි ලෙස නොලැබීම නිසා ගැටලුසහගත තත්ත්ව ඇති විය හැකි බැවින් අතුරු පාලක කමිටුවක් පත් කර එමඟින් විශ්වසනීයභාවය තහවුරු කර ගනිමින් ස්ථිරසාර විසඳුමකට යෑම සඳහා පියවර ගැනීමේ හැකියාව ඇති වේ.

ගරු කථානායකතුමනි, ස්ථිර වැඩ පිළිවෙළ තමයි අපි කියපු ක්‍රීඩා පනත සංශෝධනය. කිරීම මොකද, ක්‍රීඩාව නියාමනය කළ යුතුයි. ක්‍රීඩා නියාමනය සඳහා අධිකාරියක් පත් කිරීම වැදගත්. ඒ අධිකාරියට තමයි නියාමන බලතල සම්පූර්ණයෙන්ම දෙන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ වාගේම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට සංවර්ධන කටයුතු ටික කරන්න බලතල දෙනවා. ඔලිම්පික් සඳහා පනතේ පිටුවක් වෙනම වෙන් කරලා තිබෙනවා, ගරු විපක්ෂ නායකතුමනි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් නව ව්‍යවස්ථාවක් හදන්න මම කමිටුවක් පත් කළා.

කේ.ටී. චිත්‍රසිරි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ඒ කමිටුවෙන් ව්‍යවස්ථාවක් හැදුවා, ක්‍රිකට්වල දූෂණ, වංචා නතර වෙන්න නම් මෙවැනි ක්‍රමයකට යන්න ඕනෑ කියලා. ඒ ක්‍රමය ඇතුළේ පැහැදිලිවම සඳහන් වෙනවා කටයුතු කළ යුතු ආකාරය කොහොමද කියලා. එම යෝජිත ව්‍යවස්ථාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

පත් කරන අධ්‍යක්ෂවරුන් නාම යෝජනා කමිටුවකින් තෝරා ගත යුතුය කියලා එතුමන්ලා යෝජනා කළා. ඒ අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා, Bar Association, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය, කළමනාකරණ ගණකාධිකාරී වරුන්ගේ වරලත් ආයතනය යනාදියෙන් පත් කරන ලද අධ්‍යක්ෂවරුන් අට දෙනෙකුගෙන් සහ ඡන්දයකින් තෝරා ගන්නා ලද අධ්‍යක්ෂවරුන් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු බවට යෝජනා කර තිබෙනවා. කොච්චර ක්‍රීඩා කළත් මෙතෙක් කල් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නියෝජනය සඳහා ඡන්දයක් තිබුණේ නැහැ. ක්‍රීඩකයන්ට ඒ අවස්ථාව ලැබුණේ නැහැ; විනිසුරුවරුන්ට ලැබුණේ නැහැ; පුහුණුකරුවන්ට ලැබුණේ නැහැ. මේ යෝජිත ව්‍යවස්ථාව මඟින් අන්න ඒ අයට ඉස්සරහට යන්න ඡන්දයක් සඳහා අවස්ථාව හිමි වෙනවා. මෙහි සියලු සභිකයන් සංඛ්‍යාව 18යි. ව්‍යවස්ථාවට අනුව මේ සභිකයන් 18දෙනාටට ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට හැකියාව තිබෙනවා මිසක්, පරිපාලනයට කොහෙත්ම ඇඟිලි ගහන්න බැහැ. හැබැයි, දැන් ජනාධිපතිතුමා ගන්න හදන්නේත් කේ.ටී. චිත්‍රසිරි වාර්තාව. ඊයේත් ඒ පිළිබඳව එතුමා මාධ්‍යයට කියනවා මම දැක්කා. මට ඊයේ මේ ගැන සඳහන් කරන්නත් බැරි වුණා.

ගරු කථානායකතුමනි, කේ.ටී. චිත්‍රසිරි වාර්තාව හැදුවා විතරයි, එය ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් 301 අධිකරණ කාමරයෙන් නැවත තීන්දුවක් ලබා දීලා තිබෙනවා. සමාවෙන්න, ඒ තීන්දුව දීලා තිබෙන දිනය මේකේ සටහන් කර නැහැ. නඩු අංකය CA Writ 521/2023. අභියාචනාධිකරණ තීන්දුව අනුව එම වාර්තාව ක්‍රියාත්මක කිරීම නතර කරලායි තිබෙන්නේ. ජනාධිපතිතුමාත් හොඳ වාර්තාවක් කියලා පිළිගන්නා මේ කේ.ටී. චිත්‍රසිරි වාර්තාව ක්‍රියාත්මක කිරීම අභියාචනාධිකරණයෙන් නතර කර තිබෙනවා. අධිකරණ තීන්දුවට අපි ගරු කරනවා. නමුත් එම වාර්තාව ක්‍රියාත්මක කිරීම නවත්වලායි තිබෙන්නේ.

ව්‍යවස්ථාවක් ගෙනෙන එක කරන්න ඕනෑ, ක්‍රිකට් ආයතනයෙන්. හැබැයි ඒකට අවශ්‍ය framework එක, ඒකට අවශ්‍ය නීති ටික පනතට ඇතුළත් කිරීමේ හැකියාව පැහැදිලිවම තිබෙනවා. මේක තමයි විසඳුම විධියට අපි දකින්නේ. ගරු කථානායකතුමනි, දැන් අතරමැදි කාලයක් තිබෙනවා. වංචා, දූෂණ කිරීම නිසා එක කණ්ඩායමක් වැරැදිකරුවන් කියලා විගණකාධිපති නිර්දේශ කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන් නව ව්‍යවස්ථාවක් ගෙනල්ලා අලුත් කණ්ඩායමක් පත් කරන්න යෝජනා කර තිබෙනවා. ඒක පත් කරනතෙක් හොරුන්ටම මේක කරගෙන යන්න ඉඩ දෙනවාද, එහෙම නැත්නම් විකල්පයක් විධියට මේ රටට, ක්‍රීඩාවට ගෞරවයක් ගෙනාපු මහත්මයෙක් පත් කරලා ඒ කාලය තුළ ලංකාවේ ක්‍රිකට් හරියට හදලා ඉදිරි වැඩ පිළිවෙළකට යනවාද කියන තීන්දුව තමයි ගන්න තිබෙන්නේ. මට මේ සභාවේ අනුමැතිය ගන්න ඕනෑ වෙනවා.

විපක්ෂ නායකතුමා කිව්වා, සිනමන් ග්‍රෑන්ඩ් එකේ තිබෙන කාර්යාලය ගැන. සිනමන් ග්‍රෑන්ඩ් එකේ කාර්යාලයක් තිබෙන්නේ, අසේල රැකවට. වෙන කාටවත් නැහැ. සිනමන් ග්‍රෑන්ඩ් එකේ වෙන කාටවත් කාර්යාල නැහැ. අසේල රැකවට තමයි තිබෙන්නේ. ඒකට ගෙවන්නේ කවුද කියලා නම් මම දන්නේ නැහැ. හැබැයි, එම කාර්යාලයේ දී හරි කොතැනක හරි මේ ගොල්ලන් කථා කර තිබෙනවා නම් ක්‍රිකට් තහනම් කරවනවා කියලා, මට ඒ ගැන තේරෙන්නේ නැහැ. අපි බාල රටක්ද? දකුණු අප්‍රිකාවේ අතුරු පාලක කමිටුව තහනම් නොකරන්නත්, පාකිස්ථානයේ අතුරු පාලක කමිටුව තහනම් නොකරන්නත්, ලංකාවේ අතුරු පාලක මණ්ඩලයක 15ක්, 20ක් ඉඳලාත් තහනම් කරන්න කියලා බලකරන්නත් ඒ අයට මොකක්ද තිබෙන හයිය? මොකක්ද ඔවුන්ට තිබෙන විශේෂ වූ විධායක බලය? ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, කාලය පිළිබඳවත් ටිකක් සැලකිලිමත් වෙන්න.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු කථානායකතුමනි, මෙය වැදගත් කාරණයක්. අපට තිබෙන්නේ ජනතා පරමාධිපත්‍යයට අනුව කටයුතු කරන්නයි. මේ ගොල්ලන් අතිවිශේෂ බලයක් දාලා ක්‍රිකට් තහනම් කළොත් මිස, වෙන තහනමක් එන්නේ නැහැ. ලංකාවේ මිනිස්සු මේක පාවා දුන්නොත් ඇරෙන්න තහනමක් එන්නේ නැහැ. ඊයේ ඇමතිවරයෙක් සෘණාත්මකව කථා කළා, මේක තහනම් වුණොත් මොකක්ද අපි කරන්නේ කියලා. එහෙම නම් අපට කරන්න තිබෙන්නේ මොකක්ද? අපි දැන් හිතමුකෝ, ඒ ගොල්ලන් මේක තහනම් කළාය කියලා.

එහෙම නම් කරන්න තිබෙන්නේ අර්ජුන රණතුංග මහත්මයාට මාස 6ක් හරි, මාස 8ක් හරි මේ කටයුත්ත භාර දීලා, මෙතැන හදලා, මේ පනත සම්මත කරගෙන අපි නිලවරණයකට ගිහින් ඊළඟ තරගවලට යන එක. ඉස්සරහට යන්න ඒකට එකඟත්වය ලබා දෙන්න.

මම සඳුදා අභියාචනාධිකරණයට යනවා. එතැනින් අපි යුක්තිය බලාපොරොත්තු වෙනවා. එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. ඊළඟට තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට යන එක, මේ දූෂිත රැළ ඉවත් කරන්න. එකක්වත් නොකඩවා ඒ ක්‍රියාමාර්ග ටික මම ගන්නවා. මට තවදුරටත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වැඩ පිළිවෙළ පිළිබඳව විශ්වාසයක් නැහැ. මම, මා වෙනුවෙන් පෞද්ගලික නීතිඥවරු අල්ලනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධ ප්‍රශ්නයේදී මට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පිළිබඳ විශ්වාසයක් නැහැ. ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රිකට් ආයතනය සම්බන්ධ ප්‍රශ්නයේදී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ක්‍රියාකලාපය විශ්වාස නොකරන නිසා මා වෙනුවෙන් - ලේකම්තුමා වෙනුවෙන් එතුමා පෙනී ඉඳීවි - පෞද්ගලික නීතිඥයන් ඉදිරිපත් කරන්න අපේක්ෂා කරනවා, මේ තත්ත්වය තුළ. මොකද, දිගින් දිගටම මේ ප්‍රශ්නය කල් ඇරියා. 2018දීත් අපි මේ ප්‍රශ්නය කියනවා නේ. 2018දීත් audit එකක් කරලා තිබෙනවා. ඒ වාර්තාවත් මම දැක්කා. ඒ වාර්තාවෙනුත් වංචා, දූෂණ හෙළි කරලා තිබෙනවා. නීතිපතිතුමාට එය දීලාත් තිබෙනවා, නීතිමය ක්‍රියාමාර්ග ගන්න. නමුත්, අද වෙනකල් නීතිමය ක්‍රියාමාර්ග අරගෙන නැහැ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සල්ලි මහා බලවත්. ඒ අය අල්ලන්නේ නැති ආයතනයක් නැහැ. ඒක තමයි යථාර්ථය. ඒ අය අල්ලන්නේ නැති පුද්ගලයෙක් නැහැ, අල්ලන්නේ නැති ආයතනයක් නැහැ. ඕනෑම පුද්ගලයෙකුට තර්ජනය කරනවා. ඕනෑම පුද්ගලයෙකුගේ නම අපකීර්තියට පත් කරනවා. සමාජ මාධ්‍ය හරහා විවිධ පුද්ගලයන්ට පහර ගහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කාලය අවසන්. කෙටියෙන් ප්‍රකාශ කරන්න.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
මම අවසාන කරන්නම්, ගරු කථානායකතුමනි.

විපක්ෂ නායකතුමා තව කාරණා දෙකක් අහනවා, ඒවාටත් උත්තර දීලා මම කථාව අවසන් කරන්නම්. එතුමා අහනවා, මේ ඉවත් කිරීම පිළිබඳ කරුණු.

ගරු කථානායකතුමනි, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 සහ 32 වගන්ති යටතේ මෙසේ සඳහන් වනවා:

"31. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මඟින් නියම කරනු ලැබිය හැකිය:-

(අ) ජාතික ක්‍රීඩා සංගම් ලියා පදිංචි කිරීමේ කාර්ය පටිපාටිය සහ ඒවා ලියා පදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු;

(ආ) සංගම් සංයුතිය හා සංස්ථාපනය;

(ඇ) ඒ සංගම්වල යුතුකම්, බලතල හා කාර්යයන්;

(ඈ) ඒ සංගම්වල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම් කාර්යය පටිපාටිය; සහ

(ඉ) ඒ සංගම් විසින් ප්‍රගුණයන්, තීරකයක්, පසිඳලන්නන් සහ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ කාර්යය පටිපාටිය.

32. (අ) සංගමයේ නිලධාරීන්ගේ හෝ සාමාජිකයින්ගේ දූෂණ, විෂමාචාරය හෝ අක්‍රමිකතා යමක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයක් මඟින් දැනුම් දෙනු ලැබූ විට ඒ නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළදී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත් වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසලකා හැරීම නිසා; හෝ

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අකර්මණ්‍යව සිටීම, සහයෝගය නොදීම හෝ අවහිර කිරීම නිසා; හෝ

(ඇ) සංගමයේ යුතුකම් හෝ කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා ජාතික ක්‍රීඩා සමාජයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියා පදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

මෙම වගන්තියේ 'අමාත්‍යාංශයේ ලේකම්වරයා' යන්නට ක්‍රීඩා අධ්‍යක්ෂවරයා, සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙක් හෝ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙක් ඇතුළත් වේ."

ඒ වාගේම විපක්ෂ නායකතුමා අහනවා, මේ ප්‍රශ්නය දිගින් දිගටම ඇති නොවන්න ක්‍රියාත්මක කරන ක්‍රමය මොකක්ද කියලා. දැන් ඔය චිත්‍රසිරි මහත්මයාගේ කමිටුව හැදුවත්, 10දෙනෙක් ඡන්දයෙන් පත් වෙයි. මේකටත් කරන්න පුළුවන් උපරිම ක්‍රමය තමයි, පළාත් නවයෙන් නවදෙනෙක් පත් කරලා තව තුන්දෙනෙක් වැඩි කරලා, ක්‍රීඩකයන්ගෙන් එක් කෙනායි, විනිසුරුවන්ගෙන් එක් කෙනායි, පුහුණුකරුවන්ගෙන් එක් කෙනායි පත් කරලා 12දෙනෙක් පත් කිරීම. ගරු කථානායකතුමනි, මට තව තත්පරයක් දෙන්න. එතකොට ඒ 12දෙනාත් එක්ක මේ කමිටුව පත් කරනකොටත් අපි බලන්න වෙනවා, පහළ අය ගැන. දැන් මුරලිදරනුත් කියනවා නේ, කොළඹින් ඡන්දය ඉල්ලලා පාර්ලිමේන්තු මැතිවරණය දිනන්න පුළුවන් වුණත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනට නම් එන්න බැහැ කියලා. එහෙම නම් අපට කරන්න වෙන්නේ එක දෙයයි. අවුරුදු විසි ගණනක් තිස්සේ තිබෙන ලංකාවේම සංගම් විසුරුවා හරින්න මම තීන්දුවක් ගන්නවා. මේ අය ඉන්නේ අවුරුදු විසි ගණනකට වැඩි කාලයක් තිස්සේ. ලංකාවේම තිබෙන සංගම් විසුරුවා හැරලා නව නිලවරණයකට යන්න අපි කටයුතු කරනවාය කියන එකත් විශේෂයෙන්ම මම සිහිපත් කරනවා.

ගරු විපක්ෂ නායකතුමා අහනවා, විකාශන මුදල් ගැන.

ගිණුම විවෘත කරලා තිබෙන්නේ "ශ්‍රී ලංකා ක්‍රිකට්" නමින්. ගිණුම විවෘත කරපු කෙනාගේ නම තිබෙන්නේ, ෂනාල් කියලා. කාන්තාවක් විදියට තමයි මේකේ සඳහන් වෙලා තිබෙන්නේ. මෙන්න මේ සම්බන්ධයෙනුත් මේ විදියට මම කරුණු ඉදිරිපත් කරනවා.

ඩොලර් මිලියන දෙකේ කථාව සත්‍යයක්. ඩොලර් මිලියන දෙකේ කථාව අදත් මම තහවුරු කර ගත්තා. ඒක එතුමන්ලාගේ අනික් ගිණුමට බැර කරලා කඩිනමින් චෙක් ලියන වැඩසටහනත් යනවා. ඒකට අවශ්‍ය චෙක් පවා බැංකුවට එවලා තිබෙනවා කියන එක තමයි මම දන්නේ. මේ මොන විගණනයක්ද කියලා මම දන්නේ නැහැ. Quotations තුනක් ගෙන්වා ගෙන කිසිම දෙයක් නොකර සියයට 85ක් ගෙවලාත් ඉවරයි. ළඟිලිහියේ සල්ලි ගෙවනවා. මේක තමයි තත්ත්වය. ඉතින් මෙච්චර දූෂණයක් කරද්දී, මේ අය රකින්න කවුරු හරි උත්සාහ කරනවා නම්, මම දන්නේ නැහැ, මේ රටට යන කලදසාව මොකක්ද කියලා. ස්තූතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදනය, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*